# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

**ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි තෙවන වසර පරීක්ෂණය - 2019/2020**

**නර්තන හා නාට්‍ය කලා පීඨය**

**<u>භාෂා භාවිතය හා පර්යේෂණ ක්‍රමවේදය</u>**

**DKAD 31103/ DLCD 31193/ DSAD 31103/ DPMD 31033/ DIAK 31063/ DIAB 31063/ DHTD 31013**

කාලය :- පැ 03

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ ප්‍රශ්න අටකින් (08) සමන්විත ය.

❖ <u>එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න.

❖ එක් එක් කොටස සඳහා පිළිතුරු සැපයීමේදී පිළිතුරු ලියන පොත් වෙන වෙනම භාවිත කළ යුතුය.

❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.

❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ. (එක් පිළිතුරුක් සඳහා ලකුණු 20 ක් හිමිවේ)

---

## <u>I කොටස</u>

1. පහත සඳහන් ඡේදය වචන තුනෙන් එකක් වන සේ සාරාංශ කරන්න.

නාට්‍ය කලාවේ ආරම්භය ප්‍රාග් ඓතිහාසික යුගය කරා විහිද යන බව මානව විද්‍යාඥයන්ගේ මතය යි. නාට්‍ය ප්‍රභවය වීමෙහි ලා මූලික වශයෙන් ආදි මානවයාගේ චර්යා හේතු වන්නට ඇතැයි විශ්වාස කෙරේ. භාෂා භාවිතයෙන් තොර වූ ආදි මනවයා තම අත්දැකීම් සංනිවේදනය සඳහා අනුකරණය කිරීම, කථාන්තර කීම සහ ස්වභාව ධර්මය දේවත්වයෙන් සලකා පුදපූජා පැවැත්වීම මෙහි දී මූලික වන්නට ඇතැයි විශ්වාස කෙරේ.

ආදිමානවයා භාෂා භාවිතයට හුරු වීමට පෙර තම අදහස් හුවමාරු කරගනු ලැබුවේ අනුකරණය මගිනි. ජීවිකා වෘත්තිය සඳහා දඩයමෙහි යෙදුණු ආදි මනවයා නිරන්තරයෙන් ඉතා අවදානම් සහගත ජීවිතයක් ගෙවූයේ ය. තම කුටුම්බය ගල්ලෙනෙක හෝ වෙනත් ආරක්ෂිත ස්ථානයක රඳවා තබා දඩයම් පිණිස වනයට ගොස් ආහාර සපයා ගෙන ආපසු පැමිණි පසු වනයේ දී තමා ලත් අත්දැකීම් තම හිතෛෂිනට දැන්වීම අත්‍යවශ්‍ය වූයේ, ඇතැම් විටක තම ගෝත්‍රයට විරුද්ධ කණ්ඩායමක් තම අඩවියේ හැසිරේ නම් හෝ අන්තරායකාරී වන මෘගයෙක් වේ නම් හෝ ඔවුනගේ ආරක්ෂාව සඳහා එය දැන්විය යුතු වීමයි. නො එසේ නම් ආහාර සපයා ගැනීමේ දී තමා ලත් යම් යහපත් හෝ අයහපත් අත්දැකීමක් වූයේ නම් තම ළබැඳියන් සමග බෙදා හදා ගත යුතු වීමයි. ආදි මානවයා සතු ව භාෂාවක් නො වූ බැවින් මේ අත්දැකීම් සියල්ල සංනිවේදනය කර ගැනීමට සිදු වූයේ ඉඟි භාවිතයෙනි. එහි දී අංග චලනයෙන් තමන් ලැබූ අත්දැකීම අනුකරණය කර පෙන්වීමට ඔහුට සිදු විය. භාෂා භාවිතයට පෙර හුරුපුරුදු වූ මේ අනුකරණාත්මක සංනිවේදනය භාෂා පරිහරණයෙන් අනතුරු ව වුව ද ප්‍රාථමික සමාජයන්හි භාවිතයට ගැනිණ. වැඩිහිටියන් විසින් තම ගෝත්‍රයේ පැවැත්ම තහවුරු කිරීම සඳහා අවශ්‍ය නීතිරීති, චාරිත්‍රවාරිත්‍ර හා දඩයම් ක්‍රම වැනි එදිනෙදා ජීවන චර්යාවන් පිළිබඳ තම බාල පරම්පරාවට ඉගැන්වීමට හා සංනිවේදනය කිරීමට වාච්‍ය භාවිතයට අමතර ව භූමිකා නිරූපණය භාවිත විය. භූමිකා නිරූපණය මගින් වාච්‍යයෙන් ඉදිරිපත් කෙරෙන කරුණ වඩාත් අවධාරණාත්මක ව සංනිවේදනය කිරීමේ හැකියාව ඇති බැවින් තවදුරටත් මානවයින් අතර එය ප්‍රචලිත ව භාවිතයේ යෙදුණු බව පැහැදිලි ය.

2. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

සම්ප්‍රදාය සහ රජවරුන් විසින් ආරූඪ කරගන්නා ලද 'ව්‍යාජ-අනුහස' අතර සට්ඨන ඇති වූ අවස්ථාවලින් ලංකාවේ රාජ්‍යත්වය පිළිබඳ ඉතිහාසය ගහණ වී ඇත. රජවරුන් ශාක්ෂ්‍ය විරහිත ව උත්තරීතර බලයකට හිමිකම් කී විට හා ආදියේ පටන් පැවත ආ සද්චාරිත්‍රයනට පිටුපා කෲර ලෙස රට පාලනය කළ විට ඔවුන් සිහසුනෙන් නෙරපා දැමීමට වැසියා පෙලඹීණ. රාජ්‍යත්වයට පත් වූ පසු තමන්ගේ ක්‍රියා කලාපය සමාජ සම්මත චාරිත්‍ර වාරිත්‍ර ආදියෙන් සීමා කරනු ලබන බව ඔහු විසින් අමතක නොකළ යුතු විය. හේ ඒවාට නිගා කරමින් කටයුතු කළේ වී නම් ඔහු සිහසුනෙන් නෙරපා දැමීම යුක්ති සහගත දෙයකැයි රටවාසීහු විශ්වාස කළහ. පැරණි රජදරුවන් අනුගමනය කළ ක්‍රියා මාර්ගය පිළිපදිමින් යුක්තිය, කරුණාව, මුදිතාව, උපේක්ෂාව යනාදී ගුණාංග උසස් කොට සැලකූ චාරිත්‍රානුකූල නීති හෙවත් ව්‍යවහාර යුක්ති ධර්මයන්ට මෙන් ම ඔහුගේ අනුදැන්ම උදෙසා පැවත එන ලිඛිත නීති සහ උපදෙස්වලට අනුකූල ව සිය රාජ්‍ය විචාරණය කිරීම රජතුමන්ගෙන් අපේක්ෂා කරනු ලැබී ය. එමෙන් ම දැඩි ශ්‍රද්ධා භක්තියෙන් බෞද්ධ ප්‍රතිපත්ති අනුගමනය කිරීම ද මහජන හිතසුව පිණිස නිරතුරු කටයුතු සම්පාදනය කිරීම ද රටවැසියෝ රජතුමාගෙන් අපේක්ෂා කළහ. එදිනෙදා රාජ්‍ය පාලන කටයුතුවල දී රජතුමාට සැලකිය යුතු නිදහසක් තිබුණු අතර රජවරුන්ගේ කල්ක්‍රියාව ඒ ඒ නරපතියාගේ පෞරුෂත්වය උඩ රඳා පැවතුණි. තම සම්පූර්ණ ශක්තිය ම වෙහෙර විහාර තැනවීම වැනි පුණ්‍ය කටයුතු සඳහා කැප කළ යහපත් රජවරුන් එක් අතෙකින් සිටි අතර කෲර දුෂ්ට රජවරුන් ද අනෙක් අන්තයේ දක්නට ලැබුණි. හිතුවක්කාර පැලකයින්ට විරුද්ධ ව කැරලි ගැසීම ද දුලබ නො වී ය. **මහාවංශය** කියන පරිදි මෙවැනි කැරලි ඇති වූයේ රාජ්‍යාභිමානයෙන් ඌන වූ තමන්ගේ මෙන් ම අනුන්ගේ ශුභ සිද්ධියට අකුල් හෙලූ 'ධාර්මික ප්‍රතිපත්ති හා චිරාගත චාරිත්‍ර' උල්ලංඝණය කළා වූ රජවරුන්ට එරෙහි ව ය. බරපතල අසාධාරණකම් නිසා කුපිත වූ මහජනයා තම විරෝධය ප්‍රකාශ කිරීමට උග්‍ර ලෙස නැගී සිටි අවස්ථා ද දක්නට ඇත.

---

1. සම්ප්‍රදාය විරෝධී පාලකයන්ට රටවැසියා එරෙහි වූයේ කෙලෙසින් ද?
2. ව්‍යවහාර යුක්ති ධර්ම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
3. මෙහි දැක්වෙන දෙයාකාරයේ පාලකයෝ කවරහු ද?
4. රජුට ස්වාධීන ව කටයුතු කිරීමේ බලය අහිමි වී තිබූ බව මෙහි කියැවේ ද?
5. ලේඛකයා ඉදිරිපත් කරන කරුණු සපයා ගත් මූලාශ්‍රය කුමක් ද?

3. පහත සඳහන් යෙදුම්වල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. ප්‍රශ්ණ පත්‍රය
ii. විශිෂ්ඨතා සහතිකය
iii. සෛලමය බුදුරුව
iv. ඓස්චර්යමත් සිදුවීම
v. කළ්‍යාණ මිත්‍රයා
vi. කාළගුණ වාර්තාව
vii. උපාධි ප්‍රධානය
vii. කෞතුකාගාර පුස්ථකාලය
ix. ප්‍රගති වාර්ථාව
x. මිළට ගැනීම
xi. ඖෂධ ශාලාව
xii. ඉරුදින යාඥාව
xiii. මැතිවරණ කොට්ඨාශය
xiv. මිථ්‍යා දෘෂ්ඨිය
xv. ණයවර ලිපිය
xvi. නාම ලේඛණය
xvii. කුරුළු ගීතය
xviii. අළුත් අවුරුද්ද
ix. සෘජු භාවය
xx. භාහිර උපාධිය

---

## II කොටස

04. ඔබ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ගුණාත්මක හෝ ප්‍රමාණාත්මක හෝ මිශ්‍ර හෝ පර්යේෂණයක් උදෙසා භාවිතා කළ හැකි දත්ත රැස් කිරීමේ නියැදි/ආදර්ශ හඳුන්වා දී, එම පර්යේෂණය ක්‍රියාත්මක කිරීමේ දී මතුවිය හැකි ආචාරධාර්මික ගැටළු විස්තර කරන්න. (පර්යේෂණ ගැටළුව ආරම්භයේ දී සඳහන් කළ යුතුය.)

05. දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය අර්ථ දක්වා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පර්යේෂණ සඳහා දත්ත රැස් කිරීමේ ක්‍රම පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

06. පර්යේෂණයක සාහිත්‍යයික විමර්ශනයේ (Literature Reviw) වැදගත්කම සාකච්ඡා කරන්න.

07. සමාජ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ කෙටියෙන් හඳුන්වා එවැනි පර්යේෂණයකට සුදුසු පර්යේෂණ යෝජනාවලියක් සකස් කරන්න.

08. බුද්ධිමය දේපල ආඥාපනත මගින් (2013 අංක 18) අධ්‍යාපන කටයුතු සඳහා සාහිත්‍යමය කෘතිවලින් උපුටා ගැනීම රැකවරණයට ලක්වන ආකාරය පිළිබඳ විවරණයක් සපයන්න.

…………………. 2023.01.04